# ඉතිහාසයේ රජ කථා

## 1 කොටස



ටෙනුලි නුවංගී අබේසිංහ

# ඉතිහාසයේ රජ කථා

## 1 කොටස

ටෙනුලි නුවංගී අබේසිංහ

මහමායා බාලිකා විද්‍යාලය / මහනුවර

11/01/2025

පළමු මුද්‍රණය - 2026

ISBN : 978-624-208-926-3

සියලුම හිමිකම් ඇවිරිණි.

Tenuli Nuwangi Abeysinghe ® text copyright ©

Illustration copyright ©Layout copyright ©

All rights reserved. No part of this work may be reproduced or utilized in any form or by any means, electronic or mechanical, including photocopying, recording, or by any information storage and retrieval system, without the prior written permission of the author.

Hiranyaabeysinghe73@gmail.com

පිටකවරය - අන්තර්ජාලයෙන් නොමිලයේ ලබාගත්

ඡායාරූප යොදාගෙන නිර්මාණය කර ඇත.

හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය යටතේ රචනා කළ මෙම නිර්මාණය. E - ග්‍රන්ථයක් ලෙස 2026 මහමායා බාලිකා විදුහල මඟින් අන්තර්ජාලයට මුදාහරින ලදී.

This book was published as an E-book, on 2026, by Mahamaya Girls' College, Kandy, Sri Lanka.

Catalogue record for this book is available from The National Library and Documentation Services Board, Sri Lanka

**books by Tenuli Nuwangi Abeysinghe :**

බබයි බබාගේ දිග කොන්ඩෙයි

මාළු බබාගේ හොඳම යාළුවා

My Night mare !

**ධම්මෝ හවේ රක්ඛති, ධම්ම චාරී ( 01 කොටස )**

**ධම්මෝ හවේ රක්ඛති, ධම්ම චාරී ( 02 කොටස )**

**ධම්මෝ හවේ රක්ඛති, ධම්ම චාරී combine**

# පිදුම

**අපගේ ආදරණීය මෑණියන්ට**

**සෙනෙහෙබර පියාණන්ට**

**අපගේ ආදරණීය සොහොයුරියට**

**සෙනෙහෙබර අත්තම්මා සහ අත්තාට**

**අපගේ සියලුම ගුරුමෑණිවරුන් සහ ගුරුපියවරුන්ට**

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

## සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතරල එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොවල සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්මල මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමියල ගුරු මණ්ඩලයල සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලයල ශිෂ්‍ය දියණිවරුන්ල සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්ල අනිවාර්යල ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිමර්ාණ හැකියාවල විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවධර්නය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිමර්ාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාථර්ක වේවායි මම ප්‍රාථර්නා කරමි.

ප්‍රදීප් නිලංග දැලල
දියවඩන නිලමේල
ශ්‍රී දළදා මාළිගාව
2026-05-10

# ඉතිහාසයේ රජ කථා
# 1 කොටස

ගල් යුගය අවුරුදු ලක්ෂයකට වඩා පැවතුණි. මීට අවුරුදු 4500 - 5000 ක් අතර කාලයක දී ගල් යුගයේ සිටි මිනිසුන් වඩා දියුණු තත්ත්වයට ආහ. වළං සෑදීම, ගල් මෙවලම් වෙනුවට ලෝහ භාවිතය ඇරඹිණි.

ගොවිතැන් කිරීමට පුරුදු වූ ආදිවාසීන් මීට අවුරුදු 4400 ට පමණ පෙර කඳුකර ප්‍රදේශවල විසූහ. කඳුකර බිම්වල ඇති සානුවල ගොවිතැන් ඇරඹූහ. ඔවුන් පොළොවේ තිබෙන යකඩ ගල් උණුකර යකඩ සාදා ගෙන ඇත. තමන්ගේ දෛනික වැඩවලට යකඩ උපකරණ යොදා ගත්හ.

ඔවුන් වරිච්චි ගෙවල් සෑදූහ. වහලයට වේලුනු කොළ අතු සෙවිලි කළහ. කාලය යත් ම ඔවුන් කඳුකරයෙන් පහළ තැනිතලා බිම්වල පදිංචි වූහ. ලංකාවේ යක්ෂ, නාග, දේව යන ගෝත්‍රිකයින් සිටියහ.

# විජය රජතුමා

ක්‍රි.පූ. 544 දී විජය නම් ඉන්දියානු කුමරකු 700 ක් පිරිවර සමඟ ලංකාවට පැමිණියේ ය. ඔවුන් ගොඩබට ස්ථානය, බටහිර මුහුදු වෙරළේ ඇති තම්බපණ්ණිය යි.

යක්ෂ ගෝත්‍රික කුවේණිය මෙම 700 ට අයත් වූවන් අල්ලා සැඟවූවා ය. කපු කටිමින් සිටි කුවේණිය බිය වද්දා විජය කුමරු තම පිරිස නැවත ලබා ගත්තේ ය.

යක්ෂ ගෝත්‍රිකයන් සිටි නගර දෙක සිරියවත්ථුව සහ ලංකාපුරයයි. සිරියවත්ථු නගරයේ උත්සවයක් දින, කුවේණියගේ උදව්වෙන් විජය කුමරු සහ පිරිස, සියලු ම යක්ෂ ගෝත්‍රිකයන් විනාශ කළේ ය.

විජය කුමරු, විජය රජු ලෙස රජ විය. විජය රජුට දාව කුවේණියට, ජීවහත්ථ සහ දිසාල ලෙස දරුවන් දෙදෙනෙකු ලැබිණ. විජය කුමරු කුවේණිය අතහැර, දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රටින් කුමරියක ගෙන්වා සරණ පාවා ගත්තේ ය. විජය රජු සමඟ පැමිණි පිරිස අනුරාධපුර මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශයේ ගම්මාන ඇති කළහ. උපතිස්ස ඇමති, උපතිස්ස ගමත්, අනුරාධ ඇමති අනුරාධ ගමත්, දීඝායු ඇමති දීඝායු ගමත් පිහිටුවිය.

# අනුරාධපුර රාජධානිය

## පණ්ඩුකාභය රජතුමා

මෙතුමාගේ පියා දීඝගාමිනී කුමරු ය. මව චිත්‍රා කුමරිය යි. කුමරු රජ වීමට අකමැති වූ පිරිස් කුමරු රජ වීම වැළැක්වීමට කටයුතු කළහ. කුමරු සියලු බාධා ජයගත්තේ ය. නිසි වයසේ දී ස්වර්ණපාලී නම් කුමරිය සරණපාවා ගෙන රටේ රජු බවට පත්විය.

රජු පාලන මධ්‍යස්ථානය ලෙස "අනුරාධගම" තෝරාගත්තේ ය. පසු කලක දී එම ගම "අනුරාධපුරය" ලෙසට දියුණු කරන ලදී.

අනුරාධපුරය නම් ප්‍රදේශය වටා සීමාව ලකුණු කළේ ය. ඉන්පසු ආරක්ෂාව සඳහා ප්‍රදේශය වටා දිය අගලක් ඉදි කළේ ය. නගරයට ඇතුළු වීමට ප්‍රධාන දිශා හතරේ දොරටු 04 ක් ඉදි කළේය. දොරටු සම්බන්ධ කර නගරය පුරා මාර්ග පද්ධතියක් ඉදි කළේය. නගරය තුළ උද්‍යාන ද පොකුණු ද සාදන ලදී. නගරය පිරිසිදු කිරීමට සේවකයෝ 500 ක් ද, වැසිකිළි පිරිසිදු කිරීමට 22 ක්ද, මළ සිරුරු ගෙනයාමට 150 ක්ද, සොහොන් පිරිසිදු කිරීමට හා මුර කිරීමට සේවකයෝ 150 ක් ද පත් කළේ ය.

නගරය තුළ රෝහලක් ඉදිකරන ලදී. කම්මල් වැඩ කළ අය ඇදහූ "කම්මාරදේව" නම් දෙවියන්ට ද, වැදි ජනයාගේ දෙවියන්ට ද, නගරයේ බටහිර දොරටුව අසල දේවාල තනන ලදී. වෙනත් ආගමික පූජකයන්ට ද ගොඩනැගිලි ඉදිකරන ලදි. නගරය අසල වැව (බසවක්කුලම) නමින් වැවක් ද ඉදි කළේ ය. මෙතුමා අවුරුදු 70 ක් මෙරට රජකම් කළේ ය.

## මුටසීව රජතුමා

පණ්ඩුකාභය රජතුමාගේ පුතණුවන් ය. ඔහු "මහමෙව්නාව" නම් උයන කරවූයේ ය.

## දේවානම් පියතිස්ස රජතුමා

මෙතුමාගේ පියා මුටසීව රජු ය. මෙතුමාට සහෝදරයන් 09 දෙනෙක් ද සහෝදරියන් 02 ක් ද විය. මුටසීව රජුගෙන් පසු තිස්ස කුමරු රජවීය.

තිස්ස රජතුමා, අරිට්ඨ කුමාරයා ඇතුළු දූත පිරිසක් ඉන්දියාවට යැවීය. ඔවුන් නැවත පැමිණෙන විට රාජාභිෂේකයට අවශ්‍ය රාජකීය භාණ්ඩ ඉන්දියාවෙන් ගෙන එන ලදී. අශෝක රජුගේ උපදෙස් අනුව තිස්ස රජුගේ අභිෂේකය පවත්වන ලදී. අශෝක රජු භාවිත කළ "දේවානම් පිය" ගෞරව නාමය තිස්ස රජතුමා ද භාවිත කළේය.

බුදුහිමි පිරිනිවන්පා අවුරුදු 237 කට පසු අශෝක රජතුමාගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කළහ. මිහිඳු මහරහතන් වහන්සේත් එතුමා සමග වැඩි, ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්දසාල රහතන් වහන්සේලා ද, සුමන සාමණේර නම ද, භණ්ඩුක උපාසක ද රජතුමා ඉතා ගෞරවාදරයෙන් පිළිගන්නා ලදී.

මිහිඳු මහරහතන් වහන්සේට, මහමෙව්නා උයනත්, එහි ඉදිකළ තිස්සමහාරාමයත් පූජා කරන ලදී. ථූපාරාමය ධාන්‍යාකාර හැඩයට ඉදිකරන ලදී. (පසු ප්‍රතිසංස්කරණවල දී එය ඝණ්ඨාකාර හැඩයක් ගන්නා ලදී.)

ලහබත්ගේ නම් දාන ශාලාවත්, ඉගෙනීමට අවශ්‍ය  පිරිවෙන් ද, වෙනත් ගොඩනැගිලි ද සාදා එම මුළු ප්‍රදේශයම මහා විහාරය ලෙස නම් කර සඟසතු කොට පූජා කළේ ය.

මෙතුමාගේ පාලන කාලයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවන ලදී. එම පූජනීය වස්තුව වැඩමවා ගෙන "සංඝමිත්තා රහත් තෙරණිය" රැගත් නැව යාපනයේ "දඹකොළ පටුන" වරායට පැමිණියේ ය. එතුමිය සමග ශිල්ප ශ්‍රේණි 18 ක පිරිසද මෙරටට පැමිණියෝය.

රජතුමා උත්සවශ්‍රීයෙන් ශ්‍රී මහා බෝධිය මහමෙව්නා උයනේ රෝපණය කළේය. මහබෝ ගෙය සාදා භික්ෂූන්ට පූජා කළේ ය. පොකුණු ද තැනවීය. මිහින්තලය අවට ගල්ගුහා 68 ක් පිරිසිදු කර, අටසැට ලෙන් ලෙස භික්ෂූන්ට පූජා කළේ ය.

මිහිඳු හිමිගේ අනුශාසනාව අනුව, මහාපදුම සහ කුංජ නම් ඇතුන් දෙදෙනා විසින් අදින ලද නගුලකින් රජතුමා අනුරාධපුර නගරයේ සීමාව ලකුණු කරන ලදි.

මෙතුමා ශ්‍රී ලංකාවේ බුදුදහම වැළඳ ගත් පළමු පාලකයාය. රජුගේ ඥාති පුතකු වූ අරිට්ඨ කුමරු පැවිදි වී භික්ෂු සාසනයත්, රජුගේ සොහොයුරාගේ බිසව වූ අනුලා දේවිය පැවිදි වී භික්ෂුනී සාසනයත් ඇරඹිණ.

# එළාර රජතුමා

අනුරාධපුරය පාලනය කළේය. සොලී රජ කෙනෙකි. නීති ගරුක, ධාර්මික රජ කෙනෙකි. බටහිර මුහුදු වෙරළේ මාතොට වරායේ වෙළෙඳාම් කටයුතුවලින්ද, ගොවිතැනින් ලද ආදායම් සියල්ල රජු ලබා ගත්තේ ය. 44 අවුරුද්දක් රජ කළේ ය.

# දුටුගැමුණු රජතුමා

පියා කාවන්තිස්ස රජුය. මව විහාර මහා දේවියයි. තිස්ස යනුවෙන් සහෝදරයෙකු ද විය. ඔවුන් සිටියේ මාගම රාජධානියේ ය. (ශ්‍රී ලංකාවේ දකුණු සහ ගිනිගොඩ ප්‍රදේශයයි, රුහුණු රට)

දුටුගැමුණු කුමරු, එළාර රජු සමඟ සටන් කළේ විජිතපුරයේ දී ය. එළාර රජු පැරදවීමේ සටනට දස මහා යෝධයින් සහ කණ්ඩුල ඇතා උදව් විය.

රට එක්සේසත් කිරීමට රජුට උදව් කළ බුද්ධිමත් සහ දක්ෂ සේනා පතිවරු 10 දෙනා,

| | |
|---|---|
| නන්දිමිත්‍ර | සුරනිමල |
| මහාසෝණ | භරණ |
| ගෝඨයිම්බර | ථේරපුත්තාභය |
| වේළුසුමන | ලභියවසභ |
| ඵුස්සදේව | ඛංජදේව |

එතුමා අනුරාධපුරයේ ඉදිකළ වෙහෙර විහාර

මිරිසවැටිය, ලෝවාමාහාපාය, රුවන්වැලි සෑය.

තව ද එතුමා වෙහෙරවිහාර 99 ක් ඉදි කළේය. රුවන්වැලි සෑය ඉදිකොට අවසන් කරන්නට පෙර රජු මිය ගියේ ය. චෛත්‍යයේ කටයුතු අවසන් කළේ සද්ධාතිස්ස රජතුමා ය.

දුටුගැමුණු රජුගේ නියම නම ගාමිණී අභය යි. රජ වීමෙන් පසු දුටුගැමුණු නම භාවිත කළේ ය. දුටු යනු සංස්කෘති භාෂාවේ දෘෂ්ඨ ය. තේරුම බුද්ධිමත් යන්නයි.

රජතුමා, එළාර රජතුමා මියගිය පසු ආදාහනය කළ සොහොන අසලින් යන විට ඊට ගෞරව කළ යුතු බව අණ කළේ ය. දුටුගැමුණු රජතුමාගේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට එතුමාගේ දෙමාපියෝ ද සොහොයුරෝ ද කැප වී සිටියහ.

# වළගම්බා රජතුමා

සද්ධාතිස්ස රජුගේ පුත්‍රයා ය. මෙතුමාට සොහොයුරෝ 03 දෙනෙකි. ථූලත්ථන, ලජ්ජතිස්ස, නාග යනු ඔවුන් ය. රජතුමාගේ බිසව සෝමා දේවිය යි.

එතුමාගේ පාලන කාලයේ දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයින් පිරිසටත්, රට තුළ සිට තිස්ස නම් බ්‍රාහ්මණයාගේ කැරැල්ලටත් මුහුණ දී ඒවා ජය ගත්තේ ය.

අනුරාධපුරයේ අභයගිරිය එතුමා සෑදුවේ ය. එය කුපික්කලතිස්ස නම් වූ භික්ෂුවට පූජා කළේ ය. පසු කලෙක අභයගිරිය අන්තර්ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය.

රජතුමා කැරලි සහ ආක්‍රමණ නිසා වනගතව සිටි කාලයේ රටේ දරුණු සාගතයක් ඇතිවිය. වසර ගණනාවක් වැස්ස නොලැබුණ මෙම කාලය බැමිණිතියාසාය නම් වේ. සාගතය නිසා ධර්මය කටපාඩමින් රැගෙන ආ භික්ෂූන් පිරිස් ද අපවත් වූහ. එම නිසා බුදුරාජාණන් වහන්සේ දේශනා කළ මුළු ධර්මස්කන්ධයම ග්‍රන්ථාරූඪ කරන ලදී.

එතුමා භික්ෂූන් වහන්සේලාට ගල්ගුහා පූජා කළේ ය. ඒ බව සෙල්ලිපිවල සඳහන්ව ඇත. වළගම්බා රජුට පිත රජ යන නම ද භාවිත විය.

රජතුමාගේ බිසව සෝමා දේවිය, දකුණු ඉන්දීය ආක්‍රමණයේ දී වළගම්බා රජුව බේරා ගැනීම සඳහා සතුරන් ඉදිරියට ගියා ය. සතුරන් ඇයව දකුණු ඉන්දියාවට රැගෙන ගියේය. සතුරන් පරාජය කළ පසු රජතුමා සෝමා දේවිය නැවතත් ලංකාවට ගෙන්වා ගෙන අගබිසව තනතුරට පත් කළේය. බිසව සතුරන් ඉදිරියට ගිය තැන සෝමාරාමය සාදා භික්ෂූන් වහන්සේට පූජා කළේ ය.

මෙතුමා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනය දියුණු කිරීමට පිරිවෙන් ඉදි කළේ ය.

# වසභ රජතුමා

එතුමා ලම්බකර්ණ වංශයට අයත් ය. එතුමාගේ දෙමාපියන් කවුරුන්දැයි සඳහන් නැත. අවුරුදු 44 ක් මෙරට පාලනය කළේ ය.

එතුමා විසින් විශාල ප්‍රමාණයේ වැව් 11 ක් ඉදි කරවන ලදි.
උදාහරණ :- මයෙන්ති වැව (මහවිලච්චිය වැව)

මානාකැටි වැව (මානන්කට්ටිය වැව)
වාතමංගණ වැව (නොච්චිපොතාන වැව)

වැව්වලින් කුඹුරුවලට වතුර ගෙන යන ඇළ මාර්ග 12 ක් ඉදිකරවන ලදි.
උදාහරණ :- සැතපුම් 30 ක් දිග ඇළහැර ඇළ

නාන පොකුණු වලට පොළව යටින් තැනූ නළ මගින් ජලය ගෙන යන උමං ජල මාතිකා සාදන ලදී.

ලංකාව ප්‍රදේශවලට බෙදා එම ප්‍රදේශවල කටයුතු මෙහෙය වීමට රජයේ නිලධාරීහු පත් කළහ.

අනුරාධපුර නගරයේ ආරක්ෂාවටත්, අලංකාරයටත් නගරය වටා ප්‍රාකාරයක් ඉදි කළේ ය. නගරයේ පොකුණු ඉදිකර ඒවාට වැව්වලින් ජලය ගලා යාමට ද සැලසී ය. ඒවායේ හංසයින් ඇති කළේය.

ථූපාරාම දාගැබට වටදා ගෙයක් ද, ඉසුරුමුණි විහාරයට පොහොය ගෙයක් ද සාදා භික්ෂූන් වහන්සේලාට පූජා කළේ ය.

තිස්සමහාරාමයේ සිතුල්පව්ව විහාරයේ දාගැබක් ඉදි කළේය. ලංකාවේ විවිධ පළාත්වල තිබූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කළේය. රජයේ දේපළ පරෙස්සමින් භාවිතයටත්, ඒවා නඩත්තු කිරීමටත් බදු අය කරන ලදී.

උදාහරණ :- රජයට අයත් වැව්වලින් ජලය ලබා ගන්නා විට බදු අය කළේය. එම මුදල් එම වැව් ප්‍රතිසංස්කරණයට යෙදවීය.

වල්ලිපුරම් රන්පත ලියා ඉසිගිරිය නම් ඇමති යාපනය ප්‍රදේශයේ පාලනයට යැවූ බව දක්වා ඇත.

# මහසෙන් රජතුමා

ගෝඨාභය රජතුමාගේ පුත්‍රයා ය. ඔහුට ජේට්ඨතිස්ස නමින් සොහොයුරෙක් ද විය. ඔහු අවුරුදු 27 ක් රට පාලනය කළේ ය.

වැව් 1000 ඉදි කළේ ය. සමහරක් වැව් අති විශාල ය.
උදාහරණ :- මින්නේරිය වැව, එහි බැම්ම සැතපුම් 1 1/4 ක් දිගය. අක්කර 4670 ක වපසරියක් ඇත. (මිණිහිර වැව), වල්ලුරවාපි (හුරුළු වැව), මිහින්තලයේ බානුවාපී (කනදරා වැව)

එතුමා ඉදිකළ වෙහෙරවිහාර ගණනාවකි.

උදාහරණ :- බුදු රජාණන්වහන්සේගේ පටී ධාතුව නිදන් කොට සෑදූ ජේතවනාරාමය.
මින්නේරි විහාරය
ඒකාපිල්ල විහාරය
ගෝකණ්ණ විහාරය
දාසෙන් ගල විහාරය

රටේ තිබුණු වෙහෙර විහාර පිළිසකර කළේ ය. සාගර සේ විශාල මහවැව් ඉදිකළ නිසා රජතුමාට මින්නේරිය දෙවියන් යැයි කියයි. රට වෙනුවෙන් සහ රටවැසියා වෙනුවෙන් වෙහෙස වී වැඩ කිරීම නිසා මහසෙන් රජතුමා දෙවියෙකු ලෙස පූජාවට ලක් විය.

මෙතුමා ලංකාවේ කෘෂිකර්මාන්තයට සහ වාරි කර්මාන්තය වෙනුවෙන් ඉමහත් සේවයක් කළේය.

# ධාතුසේන රජතුමා

මෞර්ය වංශිකයෙකි. මෙතුමා බලයට පත්වීමට පෙර දකුණු ඉන්දියාවෙන් පැමිණි පණ්ඩු, පාරින්ද, බුද්ධ පාරින්ද ආදී ආක්‍රමණිකයන් 6 දෙනෙක් අනුරාධපුරය පාලනය කළහ.

ධාතුසේන රජු මොවුන්ගෙන් රට බේරා ගත්තේ ය. මෙතුමා මහ වැව් 18 සහ කුඩා වැව් 18 ක් ඉදි කළේ ය.

උදාහරණ :- කලා වැව

කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යන යෝධ ඇළ (ජය ගඟ), මෙම ඇළ සැතපුම් 54 ක් දිග ය. බෑස්ම සැතපුමකට අඟල් 6 ක් පමණි.

වෙහෙරවිහාර ඉදි කළේ ය. දිරාපත් ව තිබූ වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය කරවීම. වෙහෙර විහාර 18 ක් ඉදි කළේ ය. භික්ෂූන් වහන්සේලාට දානය වැළඳීමට මහාපාළි දාන ශාලාව ප්‍රතිසංස්කරණය කළේ ය.

ඔහුට කාශ්‍යප, මුගලන් යනුවෙන් පුතුන් දෙදෙනෙක් ද දියණියක් ද විය.

වසභ රජතුමා ලම්බකරණ රජ පෙළපතට අයත් ය. ධාතුසේන රජතුමා මෞර්ය වංශයට අයත් ය. අනුරාධපුර යුගයේ වැඩි කලක් බලය තිබුණේ ලම්බකර්ණ හා මෞර්ය වංශවලට ය. දේශපාලන බලය ලබා ගැනීමට මෙම රජ පෙළපත් අතර බල අරගල පැවතිණි. මෙම ගැටුම් නිසා රටේ ස්ථාවර පාලනයක් බිහි නොවීය. රටේ සම්පත් විශාල ලෙස විනාශ විය. දෙපාර්ශවයේම නායකයන් දකුණු ඉන්දියාවේ හමුදා මෙරටට ගෙන්වී ය. රටේ ආර්ථිකය පරිහාණියට පත්විය.

## ii වන කස්සප රජු

මෙතුමා ක්‍රි.ව. 650 දී බලයට පත්විය. වසර 09 ක් රජකම කළේ ය. රෝගීවී මිය ගියේ ය. බාලවයසේ සිටි මානවම්ම කුමරු ආරක්ෂාව පතා අප්‍රසිද්ධව කල් ගත කළේ ය. පසුව ඉන්දියාවට පලා ගියේ ය.

## ii වන දාඨෝපතිස්ස රජු

ii වන කස්සප රජුගෙන් පසු රජවිය.

# මානවම්ම රජතුමා (ක්‍රි.ව. 684 - 718)

පියා මියගිය පසුව මානවම්ම කුමරු ඉන්දියාවේ පල්ලව රාජධානියට පලා ගියේ ය. i වන නරසිංහවර්මන් පල්ලව රජුට සේවය කළේ ය. රජුගේ සටන්වලට සහාය දුන්නේ ය. i වන නරසිංහ රජු මානවම්ම කුමරු ගැන පැහැදුණි. මානවම්ම කුමරුට හමුදාවක් ලබා දුන්නේ ය. කුමරු මෙරටට පැමිණ ii වන දාඨෝපතිස්ස රජුට එරෙහිව සටන් කළේ ය.

ඉන්දියාවේ පල්ලව රජු ලෙඩ වීම නිසා ඉන්දීය හමුදාව නැවතත් ඉන්දියාව බලා ගියහ. මානවම්ම කුමරු සටන අතහැර ඉන්දියාවට පලා ගියේ ය. එසේ ගොස් තව අවුරුදු 20 ක් පල්ලව රජුට සේවය කළේ ය.

ii වන නරසිංහ රජු ද මානවම්ම කුමරු ගැන පැහැදුනි. ඔහුද මානවම්ම කුමරුට හමුදාවක් ලබා දුනි. කුමරු හමුදාව සමඟ ලංකාවට පැමිණ මෙරට හත්ථදාඨ රජතුමා පරාජය කර රජවිය. මෙතුමා රජවූයේ, ජීවිතයේ මැදිවයසයේ දී ය. වසර 35 ක් රජකම කළේ ය.

මානවම්ම රජ පෙළපත අනුරාධපුරයේ අග දක්වා වසර 300 ක් පමණ පැවතුණි.

# ii වන දප්පුල රජතුමා

වසර 16 ක් රජකම් කළේ ය.

# ෂඞ වන අග්ගබෝධි රජතුමා

ii දප්පුල රජතුමාගේ පුතා ය. වසර 03 ක් රජකම් කළේ ය.

# i වන සේන රජතුමා (ක්‍රි.ව. 833 - 853)

09 වන අග්ගබෝධි රජතුමාගේ සොහොයුරා ය. වසර 20 ක් පාලනය කළේය. මේ කාලයේ දකුණු ඉන්දියාවේ පාණ්ඩ්‍ය රාජ්‍යය බලවත් වෙමින් පැවතුණි.

ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු විශාල හමුදාවක් සමඟ පැමිණ මෙරට ආක්‍රමණය කර i වන සේන රජුගේ හමුදාව පරාජය කළේය. i වන සේන රජු ආරක්ෂාව පතා මලය ප්‍රදේශයට පලා ගියේ ය.

අනුරාධපුරයට ආ පාණ්ඩ්‍ය හමුදාව මුළු නගරයම කොල්ල කෑහ.

i වන සේන රජු හා ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය රජු සමඟ ගිවිසුමක් ඇතිවිය. පාණ්ඩ්‍යයෝ සේන රජුට නැවතත් රාජ්‍යය පවරා ඉන්දියාවට ගියහ.

i වන සේන රජු අනුරාධපුරයේ විනාශ වූ ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කළේය. රිටිගල ආරාමය, ජේතවනාරාමය, අභයගිරිය වැනි විහාර ආශ්‍රිතව නව ඉදිකිරීම් කළේ ය.

පාණ්ඩ්‍ය සටනේ දී මියගිය සොහොයුරු කස්සප කුමරුගේ පුතා, සේන කුමරු යුව රජු කොට රුහුණේ පාලනය භාර දුන්නේ ය.

# ii වන සේන රජතුමා (ක්‍රි.ව. 853 - 887)

i වන සේන රජුගේ අභාවයෙන් පසු යුවරජු ii වන සේන රජතුමා ලෙස රජකමට පත් විය. රාජ්‍ය කාලය වසර 35 කි. මේ කාලය තුළ රටේ සාමය පැවතුණි. පාණ්ඩ්‍ය ආක්‍රමණයෙන් විනාශ වූ සියල්ල යළිත් ගොඩනගන ලදී.

මිහින්තලයේ රෝහලක් කරවීම, මහවැලි ගඟේ මිණිමේකලා (මිනිපේ) නම් ප්‍රදේශයේ අමුණක් අලුත්වැඩියා කිරීම. මින්නේරිය වැවේ සොරොවුවක් තැනවීම.

පාණ්ඩ්‍ය කුමරෙකු වූ ii වන වරගුණවර්මන් කුමාරයා පාණ්ඩ්‍ය රාජ්‍යයේ උරුමය සඳහා කළ සටනක දී ආධාර ඉල්ලා ගෙන මෙරටට පැමිණියේ ය. ii වන සේන රජු කුට්ඨක සෙනවියාගේ ප්‍රධානත්වයෙන් බලවත් හමුදාවක් පාණ්ඩ්‍ය දේශයේ ආක්‍රමණයට යැවී ය. පාණ්ඩ්‍ය අගනුවර වූ මදුරාපුරය වටලා ලාංකීය හමුදාව එල්ල කළ ප්‍රහාරයෙන් ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු මරණයට පත් විය. ලාංකික හමුදාව වරගුණවර්මන් කුමරු සිංහාසනයට පත් කරන ලදී.

ලාංකික හමුදාව, i වන සේන රජු හමුවේ පාණ්ඩ්‍ය දේශයට පැහැර ගත් වස්තුවත්, පාණ්ඩ්‍ය රාජ්‍යයේ වස්තු සම්භාරයක් ද ගෙන ලංකාවට ආහ.

# v වන මිහිඳු රජතුමා (ක්‍රි.ව. 982 - 1029)

මේ වකවානුවේ මධ්‍ය පාලනය දුර්වල විය. අභ්‍යන්තර ගැටුම් උත්සන්න විය. වරින් වර ගෙන් වූ දකුණු ඉන්දීය හමුදාවට වැටුප් ගෙවීමට නොහැකි විය. එම ඉන්දීය හමුදා රජ වාසල වැටලී ය. v වන මිහිඳු රජතුමා ආරක්ෂාව පතා රුහුණට පලා ගියේ ය.

රාජ රාජ නම් චෝල අධිරාජයා ලංකාව ආක්‍රමණය කළේය. අනුරාධපුරය, පොළොන්නරුව ඇතුළු ප්‍රදේශ ගණනාවක් අල්ලා ගත්හ. පොළොන්නරුව අගනුවර කර ගත්හ.

ක්‍රි.ව. 1017 දී දකුණු ඉන්දියාවේ චෝල අධිරාජ්‍යයේ පාලකයා වූ i වන රාජේන්ද්‍ර රජු ලංකාව ආක්‍රමණය කර v වන මිහිඳු රජු සිරකරුවෙකු ලෙස චෝල දේශයට ගෙන යන ලදී.

ක්‍රි.ව. 1070 දක්වා රජරට පාලනය කළේ චෝලයන්ය. ක්‍රි.ව. 1029 දී v වන මිහිඳු රජතුමා චෝල දේශයේ දී මිය ගියේ ය.

v වන මිහිඳු රජතුමාගේ පුත් කිත්ති කුමරු/ කස්සප කුමරු/ වික්‍රමබාහු කුමරු සොයා මරා දැමීමට චෝලයෝ උත්සාහ දැරීය. මෙම කුමරුට ළමා කාලයේ සිට උපකාර කළ ප්‍රභූවරයෙකු වූයේ රුහුණේ සිත්තරු බිම් බුදල්නා හෙවත් බුද්ධ රාජ යි.

බුද්ධ රාජ කිත්ති කුමරු ඇතුළු රජ පවුලට ආරක්ෂාව සැලසී ය. ඔහු චෝලයන්ට එරෙහිව සටන් කරමින් වික්‍රමබාහු කුමරුට රුහුණේ බලය අල්ලා ගැනීමට උපකාර කළේ ය

# පොළොන්නරු රාජධානිය

## මහා විජය බාහු රජතුමා (1055 - 1110)

සතුරන්ගෙන් රට නිදහස් කර ගැනීමට කිත්ති කුමරුට, රුහුණේ පාලකයා වූ කේශධාතු කාශ්‍යප සමඟ සටන් කිරීමට සිදුවිය. කේශධාතු කාශ්‍යප පරාජය කර කිත්ති කුමරු 1055 දී කතරගම පාලන මධ්‍යස්ථානය කර ගෙන i වන විජයබාහු ලෙස රජවිය.

විජයබාහු රජු රුහුණේ බලයට පත් වූ වහාම චෝලයෝ රුහුණ ආක්‍රමණය කළහ. රජතුමා මලය දේශයට (කඳුකරයට) පලා ගියේය.

චෝලයෝ රුහුණ කොල්ලකා පොළොන්නරුවට ගියෝය. විජයබාහු රජු බුරුමය සමඟ මිත්‍ර සම්බන්ධතා ගොඩනගා ගත්තේ ය.

රුහුණේ චෝලයන්ට විරුද්ධ සටනක් සංවිධානය වන බව ඇසූ රජරට වැසියෝ චෝලයන්ට එරෙහිව කැරලි ගැසී ය.

චෝල අධිරාජ්‍යයා පොළොන්නරුවේ චෝල පාලකයාට ආධාර පිණිස හමුදාවක් එවීය. ඔවුන් රුහුණ ආක්‍රමණය කළහ. විජයබාහු රජු එම සටන ජය ගත්තේය. විජයබාහු රජු පොළොන්නරුව අල්ලා ගත්තේය. නැවතත් චෝල අධිරාජ්‍යයා පොළොන්නරුවට චෝල සේනාවක් එවීය. එම සටනින් විජයබාහු රජු පැරදී, කෑගල්ලේ වාකිරිගලට පසු බැස්සේය.

රජතුමා හම්බන්තොට මහානාගහුල ප්‍රදේශයට ගොස් හමුදා සූදානම් කළේය. 1070 දී පොළොන්නරුව ආක්‍රමණය කර පොළොන්නරුව අල්ලා ගත්තේය. මෙයින් වසර 70 ක් පැවති චෝල පාලනය බිඳ වැටුනි.

වර්ෂ 1070 සිට වසර 70 ක් පමණ විජයබාහු රජතුමා රාජ්‍යය කළේය. චෝල ආක්‍රමණය වැළැක්මවීටත් අවට රටවල් සමඟ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමටත් රජු කටයුතු කළේ ය.

රජුගේ සොහොයුරිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරෙකුට සරණපාවා දුන්නේය. එමගින් පාණ්ඩ්‍ය දේශය සමඟ මිතුරු විය.

තිලෝක සුන්දරී නම් කාලිංග කුමරිය විවාහ කරගෙන කාලිංග දේශය සමඟ මිතුරු විය. දූතයන් යවමින් තෑගි බෝග හුවමාරු කර ගනිමින් බටහිර චාලුක්‍ය සමඟ ද මිතුරු විය.

බුරුමය සමඟ ද සබඳතා ගොඩනැඟීය බුරුමයෙන් භික්ෂූන් ගෙන්වා උපසම්පදාව පිහිටුවිය. පොළොන්නරුවේ තෙමහල් දළදා මාළිගාවක් ඇති කළේය. ශ්‍රී පාදයට යන මාර්ගය ප්‍රතිසංස්කරණය කළේය. අනුරාධපුරයේ සහ රුහුණේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කළේය.

i වන විජයබාහු රජතුමාගේ මරණින් පසු කාලිංග වංශයටත්, පාණ්ඩ්‍ය වංශයටත් හිතවත් පිරිස් අතර රාජ්‍ය උරුමයට ගැටුම් ඇති විය.

එම නිසා රට දක්ඛිණ දේශය, රුහුණ හා රජරට ලෙස කොටස් 03 කට බෙදුණි. පාලන මධ්‍යස්ථාන 03 ක් ද ඇති විය.

# මහා පරාක්‍රබාහු රජතුමා (ක්‍රි.ව. 1153 - 1186)

i වන විජයබාහු රජුගේ සොහොයුරිය කිත්තා කුමරියගේ පුතා i වන මානාභරණ යි. ඔහුගේ බිරිඳ රත්නාවලී කුමරිය යි. i වන මානාභරණ දාව දක්ෂිණ දේශයේ දැදිගම කොට වෙහෙර දී පරාක්‍රමබාහු කුමරා උපන්නේය. පියාගේ මරණින් පසු පරාක්‍රමබාහු කුමාරයා දක්ෂිණ දේශයේ පාලකයා වූ කිත්සිරි මේඝ නම් සුළුපියා ළඟ හැදී වැඩුණේය.

කිත්සිරි මේඝගේ මරණින් පසු පරාක්‍රමබාහු කුමාරයාට දක්ෂිණ දේශයේ බලය හිමිවිය. ඔහු පරාක්‍රමපුරය (වර්තමානයේ පඬුවස්නුවර) ලෙස අලුත් නගරයක් ඉදි කළේ ය.

මේ වන විට පොළොන්නරුවේ සිටි වික්‍රමබාහු රජුගෙන් පසු ඔහුගේ පුත් ii වන ගජබාහු බලයට පැමිණියේය. රුහුණේ සිටි ශ්‍රී වල්ලභගේ මරණින් පසු ඔහුගේ පුත් ii වන මානාභරණ රුහුණේ බලයට පැමිණියේය.

පරාක්‍රමබාහු කුමරා ii වන මානාභරණට එරෙහිව, ii වන ගජබාහු සමඟ ගිවිසුමක් ඇති කර ගත්තේ ය.

ii වන ගජබාහුගේ මරණින් පසු ද පරාක්‍රමබාහු කුමරු ii වන මානාභරණ සමඟ සටන් කළේය. ii වන මානාභරණ පරාජය වී රුහුණට පලා ගියේ ය.

පරාක්‍රමබාහු රජු පොළොන්නරුවේ බලය පිහිටුවිය. රුහුණේ දී ii වන මානාභරණ මිය ගියේය. ඔහුගේ මව සුගලා බිසව දළදා වහන්සේ සහ පාත්‍ර ධාතුව යන පූජනීය වස්තු තමා භාරයේ තබා ගනිමින් අඛණ්ඩව, පරාක්‍රමබාහු රජුට එරෙහිව සටන් කළාය. පරාක්‍රමබාහු රජතුමා සුගලා බිසව පරාජය කළේය. සුගලා බිසව පරාජය කළ දළදා වහන්සේ සහ පාත්‍ර ධාතුව පරාක්‍රමබාහු රජතුමා භාරයට ගන්නා ලදී.

1153 දී i වන පරාක්‍රමබාහු රජු යටතේ ලංකාව නැවත එක්සේසත් විය. එතුමා වාරිමාර්ග 3910 ද මහවැව් 163 ක් ද අමුණු හා කුඩා වැව් ද තනවන ලදී. තෝපා වැව සහ දුඹුටුලු වැව ඒකාබද්ධ කර පරාක්‍රම සමුද්‍රය සාදන ලදී.

තුන් නිකාය සමගි කළේ ය. පොළොන්නරු කතිකාවක පිහිටුවිය. ගල්විහාරය, පොත්ගුල් විහාරය, පොළොන්නරුව කිරිවෙහෙර, පබළු වෙහෙර කරවිය. අනුරාධපුරයේ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කළේ ය.

මෙකල බුරුම පාලකයා වූ අලවුංසිතු රජු ලංකාවට විරුද්ධව ක්‍රියා කළේය. මේ නිසා ක්‍රි.ව. 1164 දී පරාක්‍රමබාහු රජතුමා, නගරසිරි කිත්ති සෙනෙවි යටතේ නාවික හමුදාවක් බුරුමයට යැවීය. ලාංකීය හමුදාවට ජය ලැබුණි.

මෙකල පාණ්ඩ්‍ය රාජ්‍යයේ රජකළ පරාක්‍රම පාණ්ඩ්‍යයට විරුද්ධව කුලසේකර කුමරා සටන් කළ නිසා, පාණ්ඩ්‍ය රජු පරාක්‍රමබාහු රජුගෙන් උදව් ඉල්ලීය. පරාක්‍රමබාහු රජු ලංකාපුර හා ජගත් විජය සෙනෙවියන් යටතේ සේනාවක් පාණ්ඩ්‍ය දේශයට යැවීය.

# නිශ්ශංකමල්ල රජතුමා (ක්‍රි.ව. 1187 1196)

පරාක්‍රමබාහු රජුට දරුවන් සිටියේ නැත. එම නිසා පරාක්‍රමබාහු රජුගෙන් පසුව රජ වූයේ එතුමාගේ සහෝදරියකගේ පුත් වූ දෙවන විජයබාහු රජතුමා ය. එතුමා රජ වී සිටියේ අවුරුද්දක පමණ කාලයකි. එතුමා ජීවිතක්ෂයට පත්කර මහින්ද නමැත්තා රජවිය. මහින්ද නමැත්තා රජවී පස්වන දින ඔහුව නෙරපා දමා යුව රජු ව සිටි නිශ්ශංකමල්ල රජකමට පත්විය.

නිශ්ශංකමල්ල රජතුමා ඉන්දියාවේ කාලිංග දේශයේ සිටි ජයගෝප රජතුමාගේත් පාර්වතී දේවියගෙන් පුතාය. ඔහු ඉපදී ඇත්තේ ඉන්දියාවේ දී ය. එතුමා පොළොන්නරුව කාලිංග පුර ලෙස හඳුන්වා දුන්නේය.

රජතුමා රටපුරා සංචාරය කරමින් රටවැසියාගේ සිත දිනාගැනීමට කටයුතු කළේය. රටවැසියා වෙනුවෙන් බොහෝ ආගමික සහ සුභසාධක කටයුතු කළේය. ඔහු තුලාභාර දාන දුන්නේය.

එතුමා වසර 09 ක් සිහසුන දැරීය. සොර සතුරු බිය නැති කිරීමටත් දිළින්දන්ට සැලකීමටත් එතුමා කටයුතු කළේය. බදු සහන ද ඇති කළේ ය.

පොළොන්නරුවේ හැටදාගෙයි දළඳා වහන්සේ තැන්පත් කිරීමට කැප වීය. රන්කොත් වෙහෙර, පොළොන්නරු වටදාගෙය, නිශ්ශංක ලතා මණ්ඩපය මේ රජු කර වූ ගොඩනැගිලි ය. පොළොන්නරුවේ නිශ්ශංකමල්ල රාජ සභා මණ්ඩපය ද ඉදිකරවන ලදී.

අනුරාධපුර රාජධානිය වසර 1500 ක පමණ කාලයක් ද, පොළොන්නරු රාජධානිය වසර 150 ක පමණ කාලයක් ද පැවතිණි. අනුරාධපුර හා පොළොන්නරු රාජධානි පැවති කාලය රජරට ශිෂ්ටාචාරය නම් වේ. ක්‍රි.ව. 1215 දී පොළොන්නරු රාජධානිය බිඳවැටීමේ සිට ක්‍රි.ව. 1415 දී කෝට්ටේ රාජධානිය ආරම්භ වන තෙක් වූ වසර 200 ක කාලය තුළ රාජ්‍ය මධ්‍යස්ථාන 05 ක් පැවතුණි.

පොළොන්නරුවේ නිශ්ශංක මල්ල රජුට පසුව එහි පාලනයට පත් වූයේ දුර්වල පාලකයින්ය. රාජධානිය දුර්වල වෙමින් පැවතුණි.

ක්‍රි.ව. 1215 දී කාලිංග දේශයේ සිට මාඝ නම් ආක්‍රමණිකයෙක් විශාල හමුදාවක් ගෙනවිත්, පොළොන්නරුවේ සිටි පරාක්‍රම පාණ්ඩ්‍ය රජු නෙරපා පොළොන්නරුව අල්ලා ගත්තේ ය.

ක්‍රි.ව. 1215 සිට 1232 දක්වා කාලය රටේ අවුල් වියවුල් ගහන කාලයකි. රටේ අගනුවර සතුරන් අතට පත්ව තිබුණි.

මිණිපේ ගංදෙණිය පර්වතයේ බලකොටුවක් සෑදූ සංඛ සෙනෙවියාත්, යාපහුව කඳු මුදුනෙහි බලකොටුවක් සැදූ සුභ සෙනෙවියාත්, රුහුණේ ගෝවින්ද මලය කඳු මුදුනේ බලකොටුවක් තැනූ බුවනෙකබාහු ආදිපාදතුමාත්, මාඝගේ හමුදාව ව්‍යාප්ත වීම වැළකිය.

ආරක්ෂක අවශ්‍යතා හා ආර්ථික හේතුමත රාජ්‍ය මධ්‍යස්ථානය හා අගනුවර විටින් විට හිතකර ප්‍රදේශවලට මාරු කෙරිණි.

# දඹදෙණි රාජධානිය

## iii වන විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1232 - 1236)

මෙතුමා මුලින් වන්නි නායකයෙකුව සිට ක්‍රමයෙන් බලය ගොඩනගා ගත්තෙකි. එවකට ලංකාව රුහුණු, පිහිටි, මායා ලෙස ප්‍රාදේශීයව බෙදා තිබුණි. iii වන විජයබාහු රජතුමා දඹදෙණිය අගනුවර කරගෙන මායා රට එක්සේසත් කළේය.

කාලිංග මාඝගේ ආක්‍රමණය වන විට, කොත්මලයට රැගෙන ගොස් ආරක්ෂිතව තබා තිබූ දන්න ධාතූන් වහන්සේත්, පාත්‍ර ධාතූන් වහන්සේත් දඹදෙණියට වැඩමවා කෑගල්ලේ බෙලිගල දළදා මාළිගාවක් කරවා එහි වඩා හිඳුවන ලදී. දඹදෙණියේ විජය සුන්දරාරාමය තැනවීම, කැළණි විහාරය ප්‍රතිසංස්කරණය කිරීම, උපසම්පදා මංගල්‍යය පවත්වා සංඝ සංශෝධනයක් කිරීම, ආගමික පොතපත නැවත ලිවීම මේ කාලයේ කරවන ලදී.

## ii වන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1236 - 1270)

වන විජයබාහු රජුට පරාක්‍රමබාහු සහ බුවනෙකබාහු ලෙස පුතුන් 02 ක් විය. එම රජුගේ අභාවයෙන් පසු වැඩිමහල් කුමරු 1236 දී ii වන පරාක්‍රමබාහු ලෙස දඹදෙණියේ රජවිය.

එතුමා කුඩා කල සංඝරක්ඛිත මාහිමි යටතේ හොඳ අධ්‍යාපනයක් ලද්දේ ය. එමනිසා එතුමා පාලි, සිංහල, සංස්කෘත හැදෑරූ උගතෙකි. එතුමා කව්සිළුමිණ, රචනා කළේය. කලිකාල සාහිත්‍යය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් එතුමා පිදුම් ලද්දේ ය.

ii වන පරාක්‍රමබාහු රජු කාලිංග මාඝ හා සටනට සූදානම් විය. එතුමාගේ 11 වන රාජ්‍ය වර්ෂයේ දී 1247 දී අග්නිදිග ආසියාතික ප්‍රදේශයක් වූ මලය අර්ධද්වීපයේ උතුරු ප්‍රදේශයේ සිට චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමණිකයෙකු මෙරටට ආවේය. චන්ද්‍රභානුගේ අදහස බෞද්ධ වස්තු අත්පත් කර ගැනීම විය. 1247 දී ලාංකික හමුදාව චන්ද්‍රභානු පලවා හැරියේය.

1255 දී රජුගේ හමුදාව පොළොන්නරුවට රැස් වී සිටි මාඝගේ හමුදාවට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළහ. වසර 40 ක් පමණ රජරට පාලනය කළ මාඝගෙන් රජරට මුදවා ගැනිණ.

1261 දී නැවත වරක් චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය ද පරාජයට පත්කරන ලදී. චන්ද්‍රභානු ජීවිතක්ෂයට පත්විය.

දේවපතිරාජ නම් ඇමතිවරයා යොදවා, රටේ ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල ප්‍රහල දියුණුවක් ඇති කරවීය.

මෙතුමා කෑගල්ල බෙලිගල තැන්පත් කර තිබූ දළදා වහන්සේ දඹදෙණියට වැඩම කරවන ලදී. දඹදෙණියේ මාළිගාවක් කරවා දළදා වහන්සේ එහි තැන්පත් කරන ලදී. උයන් තනවා, පාලම් තනවා, පොල් වගා කරවීම ආදී සංවර්ධන කටයුතු ද කරවීය.

# iV වන විජයබාහු රජතුමා

1270 දී ii වන පරාක්‍රමබාහු රජු මිය ගියේ ය. ඔහුගේ පුත් විජයබාහු, iV වන විජයබාහු ලෙස රජවිය. එතුමා බෝසත් විජයබාහු ලෙස ද ප්‍රසිද්ධ විය. එතුමාගේ රාජ්‍යය කාලය අවුරුදු 02 කි. රජ වාසල තුළ ඇති වූ හමුදා කුමන්ත්‍රණයකින් එතුමා ජීවිතක්ෂයට පත්විය.

# i වන බුවනෙකබාහු රජතුමා (ක්‍රි.ව. 1272 - 1284)

iv වන විජයබාහු රජුගේ සොහොයුරා බුවනෙකබාහු කුමරු කුමන්ත්‍රණය මැඩපවත්වා i වන බුවනෙකබාහු රජතුමා ලෙස 1272 දී රජවිය.

මෙතුමා වන්නි නායකයන්ගේ කැරැල්ල මැඩ පැවැත්විය. දකුණු ඉන්දියානු හමුදා කාලිංගරායර සෙන්පති සමගත් චෝඩ ගංග සෙන්පති සමගත් එල්ල කළ සතුරු ආක්‍රමණවලට සාර්ථකව මුහුණ දුන්නේ ය.

# යාපහුව රාජධානිය

i වන බුවනෙකබාහු රජතුමා දඹදෙණියේ වසර කීපයක් රජකම් කර යාපහුව තම අගනුවර කර ගත්තේ ය. එතුමා යාපහුවේ දළදා මැදුරක් කරවීය. බෞද්ධ පොත්පත් රචනා කළේ ය. විදේශ රටවල් සමඟ වෙළෙඳ සම්බන්ධතා ඇති කර ගැනීමට උනන්දු විය. වෙළෙඳ සම්බන්ධතා ඇති කර ගැනීමට ඊජිප්තුවේ සුල්තාන් වෙත යවන ලද තානාපතිවරු 1283 අප්‍රේල් මාසයේ පිළිගන්නා ලදී. 1284 දී i බුවනෙකබාහු රජු මියගියේ ය.

i වන බුවනෙකබාහු රජුගේ අභාවයෙන් පසු ඔහු පුත් ii වන බුවනෙකබාහුත්, බෝසත් විජයබාහු රජුගේ පුත් iii වන පරාක්‍රමබාහු ත් අතර රජකමට ගැටුමක් ඇතිවිය.

මේ අතර දකුණු ඉන්දියාවේ ප්‍රාදේශීය නායක ආර්ය චක්‍රවර්තී පාණ්ඩ්‍ය හමුදාවක් ගෙන පැමිණ යාපහුව බලකොටුවට පහර දී දළදා වහන්සේ රැගෙන ඉන්දියාවට ගොස් දළදා වහන්සේ පාණ්ඩ්‍ය රජු වූ කුලශේකරට දී ඇත.

iii වන පරාක්‍රමබාහු කුමරු ඉන්දියාවට ගොස් කුලශේකර රජු සමඟ සාකච්ඡා කර දළදා වහන්සේ නැවත වරක් ලංකාවට වැඩම කරවා 1287 දී පොළොන්නරුවේ රජවිය.

1293 දී ii වන බුවනෙකබාහු පොළොන්නරුව වටලා iii වන පරාක්‍රමබාහු රජු පරාජය කළේ ය. දළදා වහන්සේ කුරුණෑගලට රැගෙන ගියේය. කුරුණෑගල තම අගනුවර කර ගත්තේය.

# කුරුණෑගල රාජධානිය

ii වන බුවනෙක බාහු රජුගේ රාජ්‍ය කාලය 1293 සිට වසර 09 කි. එතුමාගේ මරණයෙන් පසු ඔහුගේ පුත් පරාක්‍රමබාහු කුමරු iv වන පරාක්‍රමබාහු රජතුමා ලෙස 1302 දී රජ විය.

එතෙක් පාලි භාෂාවෙන් පැවති පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කරන ලදී. දළදා සිරිත, සිංහල බෝධිවංශය, අනාගත වංශය, දළදා පූජාවලිය මේ කාලයේ රචනා කරන ලදී.

iv වන පරාක්‍රමබාහු රජුට පසුව පිළිවෙලින් iii වන බුවනෙකබාහු (වන්නි බුවනෙක බාහු) රජුත්, iv වන විජයබාහු (සවුළු විජයබාහු) රජුත් කුරුණෑගල පාලනය කළහ.

iii වන බුවනෙකබාහු රජතුමා කුරුණෑගල වැව තැන වීය.

# ගම්පොළ රාජධානිය

1314 දී iv වන බුවනෙකබාහු රජතුමා ගම්පොළ රාජධානිය පිහිටුවන ලදී. මෙතුමා කුරුණෑගල අවසන් රජු වූ iv වන විජයබාහු (සවුළු විජයබාහු) රජුගේ පුතෙකි. ගම්පොළ රාජධානි සමයේ දී, ගම්පොළ සමඟ රාජධානි 04 ක් ලංකාවේ විය.

1. ගම්පොළ රාජධානිය - iv වන බුවනෙකබාහු රජතුමා
2. දැදිගම රාජධානිය - iv වන බුවනෙකබාහු රජුගේ සොහොයුරා වූ v වන පරාක්‍රමබාහු රජතුමා
3. යාපන රාජධානිය - ආර්ය චක්‍රවර්තී රජ පෙළපත යටතේ
4. රයිගම රාජධානිය - අලකේශ්වර පරපුර විසින්

ගම්පොළ රජ පෙළපත සමඟ සමීප සම්බන්ධතා ඇති ප්‍රභූ පවුල් 02 ක් ද විය.

1. සේනාලංකාධිකාර සෙනවිරත් පවුල
   මොහු දැදිගම v වන පරාක්‍රමබාහු රජුගේ සොහොයුරියක් විවාහ කර ගෙන සිටියේ ය.
2. අලකේශ්වර පවුල - නිශ්ශංක අලකේෂ්වර

iv වන බුවනෙකබාහු රජු ලංකාතිලකය, ගඩලාදෙණිය විහාරය කරවීය. iv වන බුවනෙකබාහු රජුගෙන් පසු සේනාලංකාධිකාර සෙනවිරත්නගේ පුතා iii වන වික්‍රමබාහු ලෙස රජවිය.

මේ කාලයේ යාපනයේ හමුදාව ගම්පොළට පැමිණ මහජනතාවගෙන් බදු මුදල් අය කර ඇත. එමනිසා නිශ්ශංක අලකේෂ්වර කෝට්ටේ බලකොටුවක් තනවා එම ආර්ය චක්‍රවර්තීගේ බදු නිලධාරීන්ට දඬුවම් දී ඇත. කිපුණු ආර්ය චක්‍රවර්තී රජු ගම්පොළ ආක්‍රමණය කළේ ය. නිශ්ශංක අලකේෂ්වරගේ හමුදාව විසින් එකී හමුදාව පරාජයට පත් කරන ලදී.

1405, 1409, 1411 වසරවල දී චීනයේ යුංලෝ අධිරාජ්‍යයා චෙන්හෝ සෙනවියාව ලංකාවට එවීය.

1409 දී ඔහු මෙරටට එනවිට රයිගම පාලකයා වූ වීර අලකේෂ්වර එම චීන සෙනවියා පිළිගෙන නැත. ඔහු තමා ගෙන් පුද පඬුරු දෙවුන්දර දේවාලයට පූජා කර, චීන, පර්සියානු සහ දෙමළ භාෂාවලින් සෙල්ලිපියක් පිහිටුවිය. (ගාල්ල ත්‍රිභාෂා ලිපිය)

1411 දී නැවත හමුදාවක් රැගෙන විත් සටනකින් පසු වීර අලකේෂ්වර ඇතුළු සිරකරුවන් පිරිසක් චීනයට රැගෙන ගොස් ඇත.

# කෝට්ටේ රාජධානිය

ගම්පොළ රාජ්‍යය සමයේ දී නිශ්ශංක අලකේෂ්වර සෙනවියා කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් ඉදිකළේ ය. ගම්පොළ රාජ්‍ය අවසාන කාලයේ වීදාගම මහා ස්ථවීරයන් වහන්සේගේ රැකවරණයේ vi වන පරාක්‍රමබාහු කුමරු ඇතිදැඩි විය. ඔහු 1412 දී රයිගම බලයට පත් විය. එයින් වසර 03 කට පසු කෝට්ටේ ට පැමිණ 1415 දී අභිෂේක උත්සවය පවත්වන ලදී.

# vi වන පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1412 සිට 1467 දක්වා)

දීර්ඝ කාලයක් ලංකාව පාලනය කළේ ය. මෙතුමාගේ කාලයේ දී,

1. වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට යටත් කළේ ය.
2. සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.
3. උඩරට සමකාලීන පාලකයා වූ ජෝතිය සිටුවරයාගේ කැරැල්ල මැඩ පැවැත්වීම.
4. කෝට්ටේ රාජධානිය යටතේ රට එක්සේසත් කිරීම.
5. රටේ ආර්ථිකයට, අධ්‍යාපනයට, සාහිත්‍යයට විශාල සේවයක් කිරීම.

vi වන පරාක්‍රමබාහු රජුගෙන් පසු, රජුගේ දියණිය උලකුඩය දේවියගේ පුතා ජයබාහු ලෙස රජවිය. එතුමාගේ රාජ්‍ය කාලය ඉතා කෙටිය.

vi වන පරාක්‍රමබාහු රජු යාපනය යටත් කර එහි පාලනයට යොදා සිටි සපුමල් කුමරු හමුදාවක් රැගෙන විත් ජයබාහු කුමරු මරා දමා බලය අල්ලා ගත්තේ ය. 1469 දී vi වන බුවනෙකබාහු ලෙස රජවිය.

vi වන බුවනෙකබාහු රජතුමා, අම්බුලුගල කුමාරයා යොදවා පස්යොදුන් රට, සිංහල පෙරළිය/ සිංහල සංගෙ නම් කැරැල්ල මැඩ පැවැත්වීය. කැරැල්ලෙන්

අත්අඩංගුවට පත් කැකුලන්දල සිරිවර්ධන පතිරාජ ඇතුළු නායකයින්ට අභය දානය ලැබුණි. ඒ බව දැදිගම සෙල්ලිපියේ (අභයදාන ශිලා ලිපියේ) දක්වා ඇත.

vi වන බුවනෙකබාහු රජුගෙන් පසුව එතුමාගේ පුතා පණ්ඩිත පරාක්‍රමබාහු රජවිය. ඔහු vii වන පරාක්‍රමබාහු රජතුමා ය.

සතර කෝරළයේ පාලනය සිදුකළ අම්බුලුගල කුමාරයා පැමිණ පණ්ඩිත පරාක්‍රමබාහු බලයෙන් ඉවත් කොට viii වන වීර පරාක්‍රමබාහු ලෙස 1490 දී රජවිය.

1505 දී පෘතුගීසීහු ලංකාවට ආහ.

# යාපන රාජධානිය සහ වන්නියාර්වරු

ක්‍රි.ව. 13 වන සියවසේ රජරට ශිෂ්ටාචාරය බිඳවැටුණු පසු යාපනය ආශ්‍රිතව පාලන ඒකකයක් බිහිවිය. මේ පිළිබඳ මූලාශ්‍ර ඇත්තේ යාල්පාන වෛපව මාලෛ ග්‍රන්ථය, කෛලාය මාලෛ ග්‍රන්ථය, ශේගරාශශේකර මාලෛ ග්‍රන්ථය.

යාපනයේ ආරම්භකයා විජය කුලංකෛ ආර්ය චක්‍රවර්තී ය. කුලශේකර, වික්කිරම, වරෝදය, මාර්කණ්ඩ ලෙස පාලකයෝ 12 ක් සිටියහ. 1344 දී ඉබන් බතූතා මෙරටට පැමිණි කල ආර්ය චක්‍රවර්තීහු බලවත් රාජ්‍යයක් ගෙන ගියහ.

ගම්පොළ රාජධානිය කාලයේ යාපන රාජධානියේ බදු නිලධාරීන් ගම්පොළට පැමිණ බදු අයකිරීම නිසා දැදිගම නිශ්ශංක අලකේෂ්වර ඇමති ඔවුන්ට එරෙහිව කටයුතු කළේය.

කෝට්ටේ රාජධානි සමයේ vi වන පරාක්‍රමබාහු රජු සපුමල් කුමාරයා යවා යාපනය රාජධානිය කෝට්ටේ රාජධානියට යටත් කරවන ලදී. vi වන පරාක්‍රමබාහු රජුගෙන් පසු යාපන රාජධානිය කෝට්ටේ පාලනයෙන් ගිලිහුණි.

## වන්නියාර්වරු

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටුණු විට නැගෙනහිර, උතුරු මැද, වයඹ පළාත්වල ජන ඝනත්වය අඩු ප්‍රදේශවල වන්නි නම් කුඩා පාලන ඒකක ඇතිවිය. ඒවායේ අධිපතිවරු වන්නිවරු නම් වේ.

දඹදෙණි රාජධානියේ iii වන විජයබාහු රජු වන්නි නායකයෙකි. කෝට්ටේ vi වන පරාක්‍රමබාහු රජුගේ කාලය ආරම්භවන විට මෙවැනි වන්නි ප්‍රදේශ 18 ක් තිබුණි.

ii වන පරාක්‍රමබාහු සහ vi වන පරාක්‍රමබාහු රජ සමයන්වලදී වන්නි ප්‍රදේශ ප්‍රධාන රාජධානියට යටත් කෙරිණ.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "**හේමමාලා උපහාර**" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-208-926-3